# යූරියා වැඩියෙන් යෙදීමෙන් වාසියක් නෑ

කාබනික හා අකාබනික පොහොර ලෙස බෝගයේ විවිධ අවස්ථාවලදී මෙම මූලද්‍රව්‍ය බෝගයට ලබා දිය යුතුය. ශාක වර්ධනයට විශාල වශයෙන් අවශ්‍ය වන නයිට්‍රජන් පොස්පරස් හා පොටෑසියම් යන මූලද්‍රව්‍ය ප්‍රාථමික මූලද්‍රව්‍යවේ. එමෙන්ම කැල්සියම් මැග්නීසියම් හා ගෙන්දගම් යන මූලද්‍රව්‍ය අවශ්‍ය වන්නේ තරමක් අඩු ප්‍රමාණ වලිනි. මෙයට අමතරව ඉතා සුළු ප්‍රමාණවලින් බෝගවලට අවශ්‍ය වන සින්ක්, මැංගනීස්, කෝබෝල්ට්, මොලිබ්ඩිනම්, කොපර්, බොරෝන්, යකඩ, ක්ලෝරින් වැනි මූලද්‍රව්‍ය අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ලෙස සැලකේ. ඉතා සුළු ප්‍රමාණවලින් අවශ්‍යවූවද, අංශු මාත්‍ර මූලද්‍රව්‍ය බෝගවලින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ශාකවල වර්ධනය සඳහා මූලද්‍රව්‍ය 17ක් පමණ පසෙන් උරා ගනී. එනිසා වගාවන් සාර්ථක වීමට නම් මෙම මූලද්‍රව්‍ය නොකඩවා පසෙන් ලබා ගැනීමට බෝගයට හැකිවිය යුතුය. දිගුකලක් විවිධ වගාවන් සඳහා යොදා ගෙන ඇති ඉඩමක සමහර මූලද්‍රව්‍ය බෝගයට අවශ්‍ය තරම් පසෙන් නොකඩවා ලබාදිය නොහැකිය. එනිසා කාබනික හා අකාබනික පොහොර ලෙස බෝගයේ විවිධ අවස්ථාවලදී මෙම මූලද්‍රව්‍ය බෝගයට ලබා දිය යුතුය. ශාක වර්ධනයට විශාල වශයෙන් අවශ්‍ය වන නයිට්‍රජන් පොස්පරස් හා පොටෑසියම් යන මූලද්‍රව්‍ය ප්‍රාථමික මූලද්‍රව්‍යවේ. එමෙන්ම කැල්සියම් මැග්නීසියම් හා ගෙන්දගම් යන මූලද්‍රව්‍ය අවශ්‍ය වන්නේ තරමක් අඩු ප්‍රමාණ වලිනි. මෙයට අමතරව ඉතා සුළු ප්‍රමාණවලින් බෝගවලට අවශ්‍ය වන සින්ක්, මැංගනීස්, කෝබෝල්ට්, මොලිබ්ඩිනම්, කොපර්, බොරෝන්, යකඩ, ක්ලෝරින් වැනි මූලද්‍රව්‍ය අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ලෙස සැලකේ. ඉතා සුළු ප්‍රමාණවලින් අවශ්‍යවූවද, අංශු මාත්‍ර මූලද්‍රව්‍ය බෝගවලින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙයට අමතරව සිලිකා සෝඩියම් වැනි මූල ද්‍රව්‍යද බෝගවලට යම් තරමක් දුරට අවශ්‍ය බව සොයාගෙන තිබේ.

## කාබනික පොහොරක්

මේ අනුව පෙනී යන්නේ බෝගයක සාර්ථක වර්ධනයට මූලද්‍රව්‍ය ගණනාවක් අවශ්‍ය බවයි. නමුත් රසායනික පොහොර ලෙස බොහෝවිට පසට ලබා දෙන්නේ නයිට්‍රජන් පොස්පරස්, හා පොටෑසියම් යන මූලද්‍රව්‍යන් පමණි. ඉතා කලාතුරකින් ගෙන්දගම් හා මැග්නීසියම් ද මේ අන්දමට පසට ලබාදේ. බෝගවලට අවශ්‍ය සෙසු මූලද්‍රව්‍ය පසට ලබාදිය හැකි වන්නේ කාබනික පොහොර මගිනි. මෙයින් පෙනී යන්නේ බෝගයක ක්‍රමානුකූල වර්ධනය සඳහා කාබනික හා රසායනික පොහොර යන දෙවර්ගයම යෙදිය යුතු බවයි.

මෑතකදී සිට බෝගයේ අවශ්‍යතාවය නොසලකා යූරියා පොහොර පමණක් වැඩිපුර භාවිතා කිරීමට බොහෝ අය පුරුදුවී සිටිති. යූරියා මගින් පසට ලබාදිය හැක්කේ නයිට්‍රජන් පොහොර පමණි. මෙම කණගාටුදායක තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ වී වගාවට පොහොර යෙදීමේදීය.

යූරියා පොහොර පමණක් වැඩිපුර යෙදූ වගාවල කොළදාව වැඩිවන අතර එමගින් ගොයම් ගස ඇදවැටීමට ඇති හැකියාව වැඩිවන අතර, ද රෝගී හා කෘමි හානිවලට ඔරොත්තුදීමේ ශක්තිය අඩුවේ. කරල් බොල්වීම වැඩිවේ.

## සමතුලිතතාවය නැතිවේ

යූරියා මගින් නයිට්‍රජන් පමණක් සැපයෙන නිසා පසෙහි මූලද්‍රව්‍ය සමතුලිතතාවය බිඳ වැටේ. එනිසා වෙනත් මූලද්‍රව්‍ය ඌණතා බෝගය මගින් පෙන්නුම් කිරීමට ඉඩ ඇත. එකවර වැඩි ප්‍රමාණයක් යූරියා පොහොර යෙදූවිට එහි අඩංගු නයිට්‍රජන් මූලද්‍රව්‍ය විශාල වශයෙන් විනාශ වී අපතේ යා හැකිය. මෙය නිකරුනේ මුදල් නාස්තියක් පමණකි. එමෙන්ම, පොස්පරස් හා පොටෑසියම් සමඟ සසඳා බැලීමේදී නයිට්‍රජන් පෝෂ්‍ය පදාර්ථය පසෙහි එක්රැස්වී රැඳී නොපවතී.

මේ අනුව පෙනී යන්නේ මිළ අඩු කළ පමණින් යූරියා පොහොර වැඩිපුර යෙදීම හෝ එම පොහොර පමණක් යෙදීම නොකළ යුතු බවයි. බෝගයට නිර්දේශිත පොහොර ප්‍රමාණය නිවැරදි අවස්ථාවලදී පසට යෙදිය යුතුය. රසායනික පොහොර මගින් ලබාදෙන නොයෙක් ශාක පෝෂක වර්ග වැඩි කාලයක් පසෙහි රඳවා ගැනීමටද එය උපකාරකයක්වේ.